# ශ්‍රී ලංකාවේ භාවිත පුස්කොළ පොත්වල අන්තර්ගත නිදර්ශන චිත්‍ර නිර්මාණ පිළිබඳ විචාර පූර්ණ අධ්‍යයනයක්

**විභාග අංකය PG/MA/2002/01**

කැලණිය විශ්ව විද්‍යාලයේ පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ
ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

ලලිත් ජයලාල්

**2007**

TH 088

# අන්තර්ගතය

## ඓතිහාසික පසුබිම

විජය කුමරු ලංකාවට පැමිණීමට පෙර මෙහි පැවති සමාජය, හා සංස්කෘතිය කවර ආකාරයේ එකක් දැයි පැහැදිලිව විග්‍රහකිරීම දුෂ්කර වුවත්, එක්තරා ආකාරයක ලේඛන ක්‍රමයක් හා හසුන්පත් යැවීමේ හෝ හුවමාරු කර ගැනීමේ සන්නිවේදන සම්ප්‍රදායක් පැවති බව මහාවංශය පෙන්වා දෙන අතර, එතැන් සිට ලේඛන කලාවේ විකාශනය හා බැඳුනු විවිධ තොරතුරු ඓතිහාසික පසුබිම තුළින් හඳුන්වා දෙයි.

## පළමුවන පරිච්ඡේදය

දැනට ශේෂ වී ඇති මූල සාධක සීමිත ප්‍රමාණයක් මූලාශ්‍ර කර ගනිමින් පුස්කොළ පොත් ලේඛනයේ ආරම්භය හා විකාශනය පිළිබඳ තොරතුරු පළමුවෙනි පරිච්ඡේදයෙන් විස්තර කෙරේ. එසේම පුස්කොළපොත් ලේඛනයෙන් අනාවරණය වී ඇති විවිධ ක්ෂේත්‍රයන්, පුස්කොළපොත් ලේඛනය හා එහි සීඝ්‍ර වර්ධනය, ඒ සඳහා සිදුවූ විදේශීය බලපෑම්, පැරණිතම පුස්කොළපොත් හා අත් පිටපත් යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා කරනු ලැබේ.

## දෙවන පරිච්ඡේදය

පුස්කොළපොත් ලේඛනය නිසා ක්‍රමවත් හා විධිමත් ලේඛන සම්ප්‍රදායක් බිහිවූ අතර, බෞද්ධාගමික අධ්‍යාපනයේ ප්‍රවර්ධණයත් නිදර්ශන චිත්‍ර නිර්මාණයේ ආරම්භයත්, ආදීවූ විවිධ අධ්‍යාපන සංවර්ධන අවස්ථාවන් පිළිබඳ මෙහිදී සාකච්ඡා කරනු ලැබේ. එසේම පුස්කොළපොත් ලේඛනය නිසා වර්ණවත් වූ ජාතක කථා හා බෞද්ධ සාහිත්‍යය නිදර්ශන චිත්‍ර නිර්මාණයට තෝතැන්නක් වූ අයුරු මෙහිදී පෙන්වාදෙන අතර පුස්කොළපොත් ලේඛනයෙන් ආවරණය වූ විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පැහැදිලි විග්‍රහයක් කරනු ඇත.

## තුන්වන පරිච්ඡේදය

පෙරදිග අයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ඖෂධ පැළෑටි, සර්පයන් හා සර්ප විෂ ජ්‍යොතිෂය හා යන්ත්‍ර මන්ත්‍ර, බලිතොවිල්, සංගීතය, සූප ශාස්ත්‍රය ආදී වූ විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව මෙන්ම පුස්කොළපොත් හසුන්පත් හා සන්නිවේදනය පිළිබඳවද තොරතුරු රැසක් මෙම පරිච්ඡේදයෙන් අනාවරණය කෙරේ.

## සිව්වන පරිච්ඡේදය

තල්පත් ලේඛනය සඳහා සකස්කිරීම, පත්ඉරු මැදීම, කොළ කැපීම, සුළි විදීම, පොත් බැදීම, හා නිමාව අකුරු කළු මැදීම අමු ද්‍රව්‍ය ලබාගැනීම, ලේඛන කලාවට අවතීර්ණ වීම, ලේඛනයේදී භාවිත අක්ෂර විශේෂතා, විරාම ලක්ෂණ, පත් ඉරු සඳහා අංක යෙදීම, කාල නිර්ණය ආදී වූ පුස්කොළපොත් ලේඛනයට අදාල විවිධ කාර්‍යයන් පිළිබඳ මෙහිදී සාකච්ඡා කරනු ලැබේ.

## පස්වන පරිච්ඡේදය

මහින්දාගමනයෙන් පසු සිදුවූ සමාජ පරිවර්තනය චිත්‍ර කලාවේ හා නිදර්ශන චිත්‍ර නිර්මාණ කලාවේ සංවර්ධනයට බලපෑ අයුරුත්, නිදර්ශන චිත්‍ර නිර්මාණ කලාවේ ආරම්භය පිළිබඳව විදේශීය වශයෙන් ලබාගත හැකි විවිධ තොරතුරුත්, ඒ සඳහා දේශීය වශයෙන් හා ආගමික වශයෙන් ලැබෙන සම්පත් හා පහසුකම් පිළිබඳවත්, මෙහිදී කරුණු විමර්ශනය කරන අතර, මෙම පර්යේෂණ නිබන්ධය පිළිබඳව මාගේ නිගමනයන්ද පුළුල් ලෙස මෙහිදී සාකච්ඡා කෙරේ.